ICT with Prabhath

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
Information & Communication Technology

දෙවන වාර පරීක්ෂණය - 2026 — **7 ශ්‍රේණිය** / *Grade 7*
Second Term Test - 2026 — කාලය - පැය 01 *(Duration: 1 hour)*

නම : .... **පංතිය :** ....

❖ ***සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.***

01) වඩාත්ම නිවැරදි පිළිතුර ලකුණු කරන්න. — ලකුණු 20

1. පහත සඳහන් උපාංග අතුරින් මධ්‍ය සැකසුම් ඒකකයේ (CPU) කොටසක් ලෙස නොසැලකෙන්නේ,

i. ALU (Arithmetic and Logical Unit) ii. Control Unit
iii. Hard Disk iv. Memory Registers

2. රික්තක නළ (vacuum tubes) භාවිත කරන ලද්දේ පරිගණකයේ කවර පරම්පරාවේදීද?

i. පළමු පරම්පරාව ii. දෙවන පරම්පරාව
iii. තෙවන පරම්පරාව iv. සිව්වන පරම්පරාව

3. පහත සඳහන් ඒවායින් ක්ෂුද්‍ර පරිපථ (microprocessors) භාවිතයෙන් සාදන ලද පරිගණක පරම්පරාව කුමක්ද?

i. පළමු පරම්පරාව ii. දෙවන පරම්පරාව
iii. තෙවන පරම්පරාව iv. සිව්වන පරම්පරාව

4. පහත සඳහන් ඒවායින් මෙහෙයුම් පද්ධතියක් (Operating System) නොවන්නේ,

i. Microsoft Windows ii. Linux
iii. Microsoft Word iv. Mac OS

5. ඇන්ඩ්‍රොයිඩ් (Android) මෙහෙයුම් පද්ධතිය භාවිත වන්නේ,

i. ජංගම දුරකථනවල ii. මුද්‍රණ යන්ත්‍රවල
iii. ස්කෑනරයේ iv. යතුරු පුවරුවේ

6. පෑන් ධාවකය (pen drive) අයත් වන්නේ,

i. චුම්භක මාධ්‍ය උපක්‍රමයට ii. ප්‍රකාශ මාධ්‍ය උපක්‍රමයට
iii. ඝන තත්වයේ මාධ්‍ය උපක්‍රමයට iv. පරිගණක වෛරස

7. ගොනුවක් (file) සම්පූර්ණයෙන් සදහටම මකා දැමීමට භාවිත කරන යතුරු සංයෝජනය කුමක්ද?

i. Ctrl + Delete ii. Shift + Delete
iii. Alt + Delete iv. Tab + Delete

8. පහත සඳහන් ඒවායින් ට්‍රොජන් අශ්වයා (Trojan Horse) ට අදාළ නිවැරදිම විස්තරය කුමක්ද?

i. ප්‍රයෝජනවත් මෘදුකාංගයක් ලෙස පෙනී සිට රහසින් හානිකර ක්‍රියා සිදු කරයි ii. ස්වයංක්‍රීයව මෘදුකාංග යාවත්කාලීන කරයි
iii. පරිගණකයේ තාප මට්ටම පාලනය කරයි iv. ගොනු ස්වයංක්‍රීයව උපස්ථ කරයි

9. පහත සඳහන් ඒවායින් ආචයන උපාංගයක් (Storage Device) නොවන්නේ,

i. දෘඪ තැටිය ii. මවුපුවරුව
iii. පෑන් ධාවකය iv. සංයුක්ත තැටිය

10. යතුරු පුවරුවේ Caps Lock යතුර භාවිතයෙන් සිදු කරන්නේ,

i. අකුරු ලොකු අකුරු ලෙස ලිවීම ii. පිටුවක් මකා දැමීම
iii. ගොනුවක් සුරැකීම iv. ගොනුවක් නැවත නම් කිරීම

02) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය නම් ✓ ලකුණද, අසත්‍ය නම් ✗ ලකුණද යොදන්න. — ලකුණු 10

1. පාලන ඒකකය (Control Unit) මඟින් පරිගණකයට සම්බන්ධ කර ඇති ආඩාංග අතර සන්නිවේදනය, මෙහෙයවීම හා පාලනය කිරීම සිදු කරයි. ( )

2. මධ්‍ය සැකසුම් ඒකකයේ ප්‍රධාන කොටස් හතරකි. ( )

3. ෆ්ලොපි තැටිය (floppy disk) සාමාන්‍යයෙන් 1.44 MB පමණ ධාරිතාවකින් යුක්තය. ( )

4. ගොනුවක නම (file name) සහ ගොනුවේ දිගුව (file extension) අතර වෙන් කිරීමට භාවිත කරන ලකුණ “_” වේ. ( )

5. ගොනු බහාලුමක් (folder) තුළ තවත් උප ගොනු බහාලුම් තිබිය හැකිය. ( )

03) පහත වචන ලැයිස්තුව භාවිතයෙන් හිස් තැන් පුරවන්න. ලකුණු 14

මධ්‍ය සැකසුම් ඒකකය , මවුපුවරුව , මෙහෙයුම් පද්ධතිය , Save As , ගොනුවේ දිගුව , Rename , Properties , ට්‍රොජන් අශ්වයා

1. .... මගින් දෘඩාංග හා මෘදුකාංග පාලනය කිරීම, පරිශීලක අතුරුමුහුණතක් සැපයීම යනාදී කාර්යයන් ඉටු කරයි.

2. පරිගණකයේ මධ්‍ය සැකසුම් ඒකකය .... නම් උපාංගය මත ස්ථානගත කර ඇත.

3. ප්‍රයෝජනවත් මෘදුකාංගයක් ලෙස පෙනී සිටිමින්, ක්‍රියාත්මක කළ පසු පරිශීලකයාට රහසින් හානිකර ක්‍රියා සිදු කරන අනිෂ්ට මෘදුකාංගය .... ලෙස හැඳින්වේ.

4. ගොනුවක් (file) වෙනස් නමකින් හෝ වෙනත් ස්ථානයක සුරැකීමට .... විධානය භාවිත කරයි.

5. ගොනු බහාලුමක නම වෙනස් කිරීමට එය මත දකුණු බොත්තම ඔබා ලැබෙන මෙනුවෙන් .... විධානය තෝරාගත යුතුය.

6. ගොනුවක ගුණාංග (properties) නරඹනු පිණිස ගොනුව මත දකුණු මූසික බොත්තම ඔබා .... තෝරාගත යුතුය.

7. myfile.docx යන ගොනු නාමයේ '.docx' කොටස හැඳින්වෙන්නේ .... ලෙසය.

04) A තීරුවේ සඳහන් පදයට ගැළපෙන විස්තරය B තීරුවෙන් තෝරා ඉදිරියෙන් අංකය ලියන්න. ලකුණු 5

A තීරුව	B තීරුව	පිළිතුර
1. දෘඩ තැටිය (Hard Disk)	අ. පරිගණකයේ මොළය ලෙස සැලකේ	
2. මධ්‍ය සැකසුම් ඒකකය (CPU)	ආ. ජංගම දුරකථනවල භාවිත වන මෙහෙයුම් පද්ධතියකි	
3. iOS	ඇ. චුම්භක මාධ්‍ය ආචයන උපාංගයකි	
4. Compact Disk (CD)	ඈ. ප්‍රකාශ මාධ්‍ය ආචයන උපාංගයකි	
5. ෆෝල්ඩරය (Folder)	ඉ. ගොනු ඇතුළත් කර පිළිවෙළකට තැබීමට භාවිත කරයි	

05) පහත සඳහන් උපාංග / මෘදුකාංග වර්ග අනුව වගුව සම්පූර්ණ කරන්න. ලකුණු 12

දෘඩ තැටිය, සංඛ්‍යාංක බහුවිධ තැටිය (DVD), පෑන් ධාවකය, චුම්භක පටිය, බ්ලූ රේ තැටිය, ඝන තත්වයේ තැටි ධාවකය (SSD), සංයුක්ත තැටිය (CD-RW), මතක කාඩ්පත

චුම්භක මාධ්‍ය උපක්‍රම	ප්‍රකාශ මාධ්‍ය උපක්‍රම	ඝන තත්වයේ මාධ්‍ය උපක්‍රම

06) මධ්‍ය සැකසුම් ඒකකයේ (CPU) ප්‍රධාන කොටස් 03 නම් කර, එක් එක් කොටසෙහි කාර්යය සඳහන් කරන්න. ලකුණු 06

i. ....
- ....

ii. ....
- ....

iii. ....
- ....

07) සමචතුරශ්‍රයක වර්ගඵලය සෙවීම සඳහා ගැලීම් සටහනක් අඳින්න. ලකුණු 11